# ශ්‍රී ලංකා බෞද්ධ සහ පාලි විශ්වවිද්‍යාලය

## තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගෙන් 2021.01.04 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

අධ්‍යයන කාර්ය මණ්ඩලය

**01. මහාචාර්ය තනතුර**

පාලි අධ්‍යනාංශය / පුරාවිද්‍යා අධ්‍යනාංශය / සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශනය අධ්‍යනාංශය / බෞද්ධ සංස්කෘතිය අධ්‍යනාංශය / බෞද්ධ දර්ශනය අධ්‍යනාංශය

2014.04.01 දිනැති අංක 04/2014 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය සහ 2010.03.19 දිනැති අංක 04/2010 දරන ආයතන චක්‍රලේඛ ලිපිය සහ 2009.09.30 දිනැති අංක 916 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව අයදුම්පත පහත දක්වා ඇති ලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.

අ) ජීව දත්ත තොරතුරු පත්‍රිකාව

ආ) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුව ඉගැන්වීම් හා අධ්‍යයන සංවර්ධන පර්යේෂණ හා නිර්මාණාත්මක කටයුතු, දැනුම බෙදා හැරීම හා විශ්වවිද්‍යාලීය හා ජාතික සංවර්ධනය උදෙසා ලබා දෙන ලද දායකත්වය විශේෂයෙන් සඳහන් කරමින් වෘත්තීය පිළිබඳව ලබා දෙන ස්වයං තක්සේරුවක්.

ඇ) ප්‍රකාශන, පර්යේෂණ පත්‍රිකා සහ වෙනත් අදාළ ලේඛනවල පිටපත් තුනක්.

ඈ) විශිෂ්ඨ පර්යේෂණ පත්‍රිකා පහක (05) මාතෘකා (ප්‍රකාශන)
(ඉහත චක්‍රලේඛ www.ugc.ac.lk වෙබ් අඩවියෙන් බා ගත කළ හැකි වේ.)

**දැනට විශ්වවිද්‍යාලයන් හි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරු දරන ආචාර්යවරුන්ටද මේ සඳහා අයදුම්කළ හැකිය.**

2015.05.28 දිනැති අංක 05/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව අයදුම්පත පහත දක්වා ඇති ලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.

අ) ජීව දත්ත තොරතුරු පත්‍රිකාව

ආ) ඉගැන්වීම් කටයුතු හා අධ්‍යයන සංවර්ධන පර්යේෂණ සහ නිර්මාණාත්මක කාර්යයන් සහ දැනුම බෙදා දීම සම්බන්ධයෙන් ඔහු / ඇය ලබා දුන් දායකත්වය සහ මහාචාර්යවරයෙකු වීමෙන් අනතුරුව

විශ්වවිද්‍යාලයීය හා ජාතික සංවර්ධනය වෙනුවෙන් ඔහු / ඇය ලබා දුන් දායකත්වය පිළිබඳ ස්වයං තක්සේරුවක්.

**02. පුස්තකාලය**

**2.1 පුස්තකාලයාධිකාරි**

**සටහන:**

* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2010 අප්‍රේල් මස 23 දිනැතිව නිකුත් කර ඇති අංක 921 දරන චක්‍රලේඛයේ දැක්වෙන සුදුසුකම්වලට අනුව පුස්තකාලයාධිකාරී තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

**03. පීඨය - බෞද්ධ අධ්‍යයන පීඨය**

**3.1 තනතුර** - කථිකාචාර්ය (ආධුනික) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I / II ශ්‍රේණිය

**විෂය** - බෞද්ධ දර්ශනය

**3.2 තනතුර** - පරිගණක තාක්ෂණ උපදේශක - II ශ්‍රේණිය

**විෂය** - තොරතුරු තාක්ෂණය

**04. පීඨය - භාෂා අධ්‍යයන පීඨය**

**4.1 තනතුර** - කථිකාචාර්ය (ආධුනික) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I / II ශ්‍රේණිය

**විෂය** - සංස්කෘත

**4.2 තනතුර** - කථිකාචාර්ය (ආධුනික) / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I / II ශ්‍රේණිය

**විෂය** - සිංහල

* (අයදුම්කරුට සිංහල හා ඉංග්‍රීසි යන මාධ්‍ය දෙකෙන් ම ඉගැන්වීමේ හැකියාව තිබිය යුතුය.)

**සටහන:**

* 2005 නොවැම්බර් 03 දිනැති අංක 17/2005 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව, අපේක්ෂකයින් ඔවුන්ගේ සුදුසුකම්වලට අනුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරට (II / I ශ්‍රේණිය) සඳහා පත් කරනු ලැබිය හැකි වේ.

**සුදුසුකම්:**

**පුස්තකාලයාධිකාරි**

1. (i) විශේෂ උපාධියක පළමු හෝ දෙවන පෙළ (ඉහළ) සාමර්ථ්‍යයක් ලබා තිබීම **හෝ**

   (ii) විශේෂ උපාධියක දෙවන පෙළ (පහළ) සාමර්ථ්‍යයක් ලබා තිබීම හෝ සාමාන්‍ය උපාධියක පළමු පන්තියේ හෝ දෙවන පෙළ (ඉහළ) සාමර්ථ්‍යයක් ලබා තිබීම; **හෝ**

   (iii) උපාධි විභාගයකින් සමත් වීම සහ උපාධි නිබන්ධනය / ශාස්ත්‍රීය නිබන්ධනයක ආකාරයෙන් පර්යේෂණ අංගයක් සහිතව පුස්තකාල සහ විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ අවම වශයෙන් අධ්‍යයන වර්ෂ දෙකක කාලයක් හදාරන ලද පශ්චාත් උපාධියක් සමත්ව තිබීම;

**සහ**

2. උපාධි නිබන්ධනයක / ශාස්ත්‍රීය නිබන්ධනයක ආකාරයෙන් වූ පර්යේෂණ අංගයක් සහිතව අවම වශයෙන් අධ්‍යයන වර්ෂ දෙකක (හෝ ඊට සමාන අර්ධ කාලීන අධ්‍යයන පාඨමාලාවක්) පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව ලබාගත් පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හෝ ආචාර්ය උපාධියක් ලබා තිබීම;

**සහ**

3. පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රකාශන.

**සහ**

4. පළමු උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව, පහත සඳහන් එකක් හෝ දෙකම පිළිබඳ අවම වශයෙන් අවුරුදු පහළොවක (15) පළපුරුද්දක් හෝ ඉහත (2) හි සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව පහත සඳහන් එකක් හෝ දෙකේම අවම වශයෙන් අවුරුදු දහයක (10) වත් පළපුරුද්දක් ලබා තිබීම:

   (i) පිළිගත් පුස්තකාලයක පුස්තකාලයාධිකාරි තනතුර දැරීමෙන් ලබා ගත් පළපුරුද්ද;

   (ii) පුස්තකාල හා විඥාපන විද්‍යා පර්යේෂණ

**සහ**

5. අවම වශයෙන් පුස්තකාලයාධිකාරි තනතුර සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමයේ සඳහන් අවම ලකුණු ලබා තිබීම

**කථිකාචාර්ය (ආධුනික) (වෛද්‍ය / දන්ත) නොවන**

(1) පළමු හෝ දෙවන පෙළ (ඉහළ) ගෞරව සාමර්ථ්‍යයක් සහිතව අදාළ විෂය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම සහ ඉගැන්වීමේ / පර්යේෂණ / වෘත්තීය කටයුතු / පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු පිළිබඳ අවම වශයෙන් අවුරුදු 01 ක පළපුරුද්දක් ලබා තිබීම.

<u>හෝ</u>

(2) දෙවන පෙළ (පහළ) ගෞරව සාමර්ථ්‍යයක් සහිතව අදාළ විෂය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම සහ ඉගැන්වීම් / පර්යේෂණ / වෘත්තීය කටයුතු / පශ්චාත් උපාධි අධ්‍යයන පිළිබඳ අවම වශයෙන් අවුරුදු 01 ක පළපුරුද්දක් ලබා තිබීම.

<u>හෝ</u>

(3) (අ) ගෞරව සාමර්ථ්‍යයක් රහිතව අදාළ විෂය පිළිබඳ විශේෂීකරණ උපාධියක් ලබා තිබීම හෝ අවම වශයෙන් දෙවන පන්තියේ ගෞරව සාමර්ථ්‍යයක් සහිතව වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම සහ

(ආ) උපාධි නිබන්ධනයක / ශාස්ත්‍රීය නිබන්ධනයක ආකාරයෙන් වූ පර්යේෂණ අංගයක් සමඟ අවම වශයෙන් අධ්‍යයන වර්ෂ 02 ක කාලයක් සහිතව අදාළ විෂයයෙන් පශ්චාද් උපාධියක් ලබා තිබීම;

<u>හෝ</u>

(4) අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ නිර්දේශය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත කළ හැකි එවැනි අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් හෝ වෘත්තීය පළපුරුද්ද.

**සටහන්:**

(අ) ඉහත (2) හෝ (3) යටතේ සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවෙකු පත්වීම සඳහා සලකා බැලිය හැක්කේ ඉහත (1) යටතේ සුදුසුකම් ඇති අයදුම්කරුවන් නොමැති විට හෝ තේරීම් කමිටුව විසින් ඇගයීමට ලක් කර අසතුටුදායක ලෙස සලකනු ලැබේ නම් පමණි. එවැනි පත්වීමක් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සුවිශේෂී සාධාරණීකරණය හා අනුමැතිය අවශ්‍ය විය හැකි වේ.

(ආ) අදාළ විෂය පිළිබඳ විශේෂ උපාධියක් සමඟ සහ පළමු හෝ දෙවන පෙළ (ඉහළ) ගෞරව සාමර්ථ්‍යයක් සහ උපාධි නිබන්ධනය / ශාස්ත්‍රීය නිබන්ධනය ආකාරයෙන් වූ පර්යේෂණ අංගයක් සමඟ අධ්‍යයන වර්ෂ 02 ක කාලයක් හදාරන ලද ශාස්ත්‍රපති උපාධියක් සහිත ව බඳවා ගත් අයදුම්කරුවෙකු B-04 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයට වඩා එක් පියවරක් ඉහළ වැටුප් තලයක ස්ථානගත කරනු ලැබිය හැකිය.

(ඇ) පළමු හෝ දෙවන පෙළ (ඉහළ) ගෞරව සාමර්ථ්‍යයක් සහිතව අදාළ විෂය පිළිබඳ විශේෂ උපාධියක් සහ

ආචාර්ය උපාධියක් ද සමඟ බඳවා ගන්නා ලද අයදුම්කරුවෙකු B-04 වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයට වඩා වැටුප් පියවර දෙකක් (02) ඉහළ වැටුප් තලයක ස්ථානගත කරනු ලැබිය හැකි වේ.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, II ශ්‍රේණිය [(වෛද්‍ය / දන්ත) නොවන]**

(1) මෙම ලේඛනයේ 2 වන තනතුර යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි කථිකාචාර්ය (ආධුනික) [(වෛද්‍ය / දන්ත) නොවන] තනතුර සඳහා අවශ්‍ය අධ්‍යයන සුදුසුකම් අපේක්ෂකයින් සතුව තිබිය යුතු වන්නේය.

<u>සහ</u>

(2) (i) උපාධි නිබන්ධනයක / ශාස්ත්‍රීය නිබන්ධනයක ආකාරයෙන් වූ පර්යේෂණ අංගයක් සහිතව අවම වශයෙන් අධ්‍යයන වර්ෂ දෙකක (හෝ ඊට සමාන අර්ධ කාලීන අධ්‍යයන පාඨමාලාවක්) පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව අදාළ විෂයයෙන් ලබා ගත් ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම හෝ ආචාර්ය උපාධියක් ලබා තිබීම.

කලා, මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, නීතිය හා කළමනාකරණ / ව්‍යාපාර අධ්‍යයන යන පීඨ සම්බන්ධයෙන් වන අවස්ථාවක, වර්තමාන මාර්ගෝපදේශවලට අනුකූලව ඇගයීමට ලක් කළ පර්යේෂණ වාර්තාවක් සමඟ සංයුක්ත කළ වසරක කාලසීමාවක් තුළ දී අදාළ ක්ෂේත්‍රයෙන් ලබා ගත් ශාස්ත්‍රපති උපාධියක් පිළිගත හැකි වනු ඇත. (පහත සටහන බලන්න)

<u>හෝ</u>

(ii) අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ නිර්දේශය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළ හැකි එවැනි වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද.

<u>සහ</u>

(3) පහත සඳහන් එකක හෝ වැඩි සංඛ්‍යාවක අවම වශයෙන් අවුරුදු හයක (06) පළපුරුද්දක් ලබා තිබීම: -

(i) විශ්වවිද්‍යාල මට්ටමින් ඉගැන්වීම,

(ii) වෘත්තීය පළපුරුද්ද,

(iii) පිළිගත් ආයතනයක පර්යේෂණ සිදු කර තිබීම,

(iv) ඉහත (2) හි සඳහන් සුදුසුකම් ලබා ගැනීම සඳහා පශ්චාද් උපාධි අධ්‍යයන කටයුතු සිදු කර තිබීම.

**පරිගණක තාක්ෂණ උපදේශක - II ශ්‍රේණිය**

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පන්තියේ සාමර්ථ්‍යයක් සහිතව පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබා තිබීම:

**<u>හෝ</u>**

(ii) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව / පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය සමත්ව තිබීම

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණකකරණය විෂය සංරචකයක් වශයෙන් හදාරමින් පළමු හෝ දෙවන පන්තියේ සාමර්ථ්‍යයක් සහිතව විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම.

**සහ**

(ආ) ක්ෂේත්‍රයේ හෝ පරිගණකකරණයේ එක් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

(iii) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණකකරණය විෂය සංරචකයක් වශයෙන් හදාරමින් විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය සමත්ව තිබීම.

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පන්තියේ සාමර්ථ්‍යයක් සහිතව විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය (පරිගණකකරණය විෂය සංරචකයක් නොවන) ලබා තිබීම.

**සහ**

(ආ) ක්ෂේත්‍රයේ හෝ පරිගණකකරණයේ වසර දෙකක පළපුරුද්ද.

(iv) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය (පරිගණකකරණය විෂයයක් නොවන) සමත්ව තිබීම.

**සහ**

(ආ) ක්ෂේත්‍රයේ හෝ පරිගණකකරණයේ වසර තුනක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

(v) වෙනත් ඕනෑම උපාධියක්

**සහ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව / පරිගණක තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම

**සහ**

ක්ෂේත්‍රයේ හෝ පරිගණකකරණයේ එක් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණ:**

| | | | | | |
|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 (I) | - | **රු.** | 139175 - 11x2925 -171350 | **(මසකට)** |
| මහාචාර්ය | U-AC 5 (II) | - | **රු.** | 117350 - 13x2700 -152450 | **(මසකට)** |
| පුස්තකාලයාධිකාරි | U-AC 5 (II) | - | **රු.** | 117350 - 13x2700 -152450 | **(මසකට)** |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) | U-AC 3 (I) | - | **රු.** | 91310 - 7x2170 - 106500 | **(මසකට)** |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) | U-AC 3 (II) | - | **රු.** | 79360 - 11x1630 - 97290 | **(මසකට)** |
| කථිකාචාර්ය (ආධුනික) | U-AC 3 (IV) | - | **රු.** | 54600 - 10x1335 - 67950 | **(මසකට)** |
| පරිගණක තාක්ෂණ උපදේශක - II ශ්‍රේණිය | U-AS 2 | - | **රු.** | 50625 - 17x1335 - 74655 | **(මසකට)** |

2017 ජුනි 15 දිනැති අංක 13/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව අධ්‍යයන දීමනාව ද පහත පරිදි ගෙවනු ලැබේ.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | වැටුපෙන් 167% |
| මහාචාර්ය | වැටුපෙන් 162% |
| පුස්තකාලයාධිපති | වැටුපෙන් 162% |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (1 ශ්‍රේණිය) | වැටුපෙන් 151% |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) | වැටුපෙන් 151% |
| කථිකාචාර්ය (ආධුනික) | වැටුපෙන් 115% |

**සප්ත වාර්ෂික නිවාඩු:**

පුස්තකාලයාධිකාරි සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ සහ ඊට ඉහළ තනතුරු දරන්නන් වසර හතක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, සම්පූර්ණ වැටුප සහිත වසර එකක සප්තවාර්ෂික නිවාඩුවක් හෝ වැටුප් රහිත වසර දෙකක සප්තවාර්ෂික නිවාඩුවක් හෝ ලබා ගැනීමට අදාළ තැනැත්තා මෙන්ම කලත්‍රයා ද පූර්ණ වශයෙන් හිමිකම් ලබයි.

**ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ:**

- ❖ පත්වීම්ලාභියා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ස්වකීය මාසික වැටුපෙන් 10% ක දායකත්වයක් ලබා දෙනු ලබන දායකයකු වනු ඇත. විශ්වවිද්‍යාලය ද, පත්වීම්ලාභියාගේ මාසික වැටුපෙන් 15% කින් සහ 3% කින් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට අනුපිළිවෙලින් දායකත්වය ලබා දෙනු ඇත.
- ❖ පාරිතෝෂික ගෙවීම

**වෙනත් ප්‍රතිලාභ:**

- ❖ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අනුව, එක් එක් තනතුර සඳහා වෙනත් දීමනා ගෙවනු ලැබේ.
- ❖ වෛද්‍ය පහසුකම්.

**විශේෂ සටහන**

* ඉහත තනතුරු සඳහා පත්කරනු ලබන තැනැත්තන් විසින් මෙම විශ්වවිද්‍යාලයේ පළමු පත්වීම ලැබූ දින සිට වසර පහක් දක්වා අඛණ්ඩ සේවාවක් ලබා දීම සඳහා වන ගිවිසුමකට අත්සන් තැබිය යුතුය.

**ඉල්ලුම් කළ යුතු ආකාරය:**

සුදුසුකම් පිළිබඳ විස්තර 2020.12.30 දක්වා මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරි (පාලන) කාර්යාලයට පුද්ගලිකව පැමිණීමෙන් හෝ ලිපිනය ලියන ලද, රු. 40.00 මුද්දර ඇල වූ සෙන්ටිමීටර් 23x10 ප්‍රමාණයේ ලියුම් කවරයක ඉහළ වම් කෙළවරේ තනතුර සඳහන් කර විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරි (පාලන) වෙත ලැබෙන පරිදි තැපෑලෙන් එවීමෙන් හෝ විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වන **www.bpu.ac.lk** වෙතින් බාගත කිරීම මගින් හෝ ලබා ගත හැකිය.

අදාළ සහතිකවල පිටපත් සහිතව නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඒවා බහාලන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ ඉල්ලුම් කරන ලද තනතුර සඳහන් කර **2021.01.04 දින හෝ ඊට පෙර "සහකාර ලේඛකාධිකාරී (පාලන), ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, අංක 37, මොරගහහේන පාර, පිටිපන නගරය, හෝමාගම"** යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

තෝරා ගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ඉහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල නොවන අයදුම්පත් ද, අසම්පූර්ණ, අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
අංක 37, මොරගහහේන පාර,
පිටිපන නගරය,
හෝමාගම.
2020.12.02